# පාඨමාලා විස්තර සටහන 2025




**කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය**

ජාතීන්ගේ සංවර්ධනය උදෙසා සභාවට සම්පත්

# කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය

*ජාතීන්ගේ සංවර්තනය උදෙසා සභාවට සම්පත්*

# පාඨමාලා විස්තර සටහන
# 2025

ශ්‍රී ලංකාව තුළත් ඉන් ඔබ්බටත්, සභාව තුළ මෙන්ම වැඩපොළේද, සේවයේ නිරතව සිටින ඇදහිලිවතුන්, ක්‍රිස්තු ගුණැති නායකයින් වන පිණිස, දේවධාර්මික අධ්‍යාපනයක් තුළින් සන්නද්ධ කිරීමට, කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය කැපවී සිටී.

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේදී, ඔබ විවිධ ක්‍රිස්තියානි නිකායන්වල ඇදහිලිවන්තයන් සමඟ එකට කටයුතු කරමින් ඉගෙන ගන්නා බැවින්, සියලු ක්‍රිස්තියානි සම්ප්‍රදායන් වල ඇති සාරවත්බව අත්දැකීමට ලැබෙන දේවධර්ම ශාස්ත්‍රාලයකි.

ක්‍රිස්තියානි එකමුතුකම කෙරෙහි කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ කැපවීම මුල් බැස ඇත්තේ ශුද්ධ ලියවිල්ලේ අධිකාරිය මතය. අප එකමුතු වන්නේ, බයිබලය අපගේ ඇදහිල්ල සහ ජීවිතය සඳහා එකම මාර්ගෝපදේශය බවට ඇති හවුල් විශ්වාසය වටාය.

එන්න, කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ අධ්‍යාපන ලබන්නන්ගේ විචිත්‍ර ප්‍රජාවට එකතු වී, අධ්‍යාපනය, ආත්මික වර්ධනය සහ දේව සේවය සඳහා වලදායී නිපුණතා වර්ධනය කර ගැනීම පෙරදැරි කරගත් ආකර්ෂණීය ගමනක් අරඹන්න!

**1971 අංක 32 දරන ශ්‍රී ලංකා පාර්ලිමේන්තු ආඥා පනත මගින් සංස්ථාපිත**
**ආසියාතික දේවධර්ම සංගමයේ තෘතික අධ්‍යාපන ආයතනයක් ලෙස පිළිගත් (ATA)**
**කොළඹ බයිබල් විද්‍යාලයේ එකම අංශයයි.**
**ශ්‍රී ලංකා ජාතික ධර්මදූත සන්ධානයේ හා (NCEASL)**
**ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයේ සාමාජික (NCCSL)**

# සන්නිවේදන තොරතුරු

| | |
|---|---|
| **ලේඛකාධිකාරී** | registrar@cts.lk |
| **සම්බන්ධීකාරක: ශාස්ත්‍රීය වැඩසටහන්** | student.services@cts.lk |
| **ශිෂ්‍ය ගිණුම් කටයුතු** | student.accounts@cts.lk |
| **අධ්‍යයන ශිෂ්‍යත්ව** | scholarships@cts.lk |
| **පුස්තකාලය** | library@cts.lk |
| **තොරතුරු තාක්ෂණය** | it@cts.lk |
| **ප්‍රායෝගික සේවා පුහුණුව** | practicums@cts.lk |
| **උපදේශන වැඩසටහන්** | counselling@cts.lk |
| **ශාස්ත්‍රපති වැඩසටහන්** | ma@cts.lk |
| **ළමා සේවා ක්ෂේත්‍රය** | cm@cts.lk |
| **සහකාර පීඨාධිපති**<br>ජූලියන් දේවදසන් මහතා | julian@cts.lk |
| **පීඨාධිපති**<br>දේවගැති රවින් කල්දේරා | ravin@cts.lk |

# පටුන


| | *පිටු අංකය* |
|---|---|
| **පොදු තොරතුරු** | **4** |
| **1 වාරය: ජනවාරි-අප්‍රේල්** | |
| කාල සටහන | **6** |
| උදෑසන සහ දහවල් පැවැත්වෙන පාඨමාලා | **7 – 9** |
| සවස පැවැත්වෙන පාඨමාලා | **9 – 10** |
| කෙටි කාලීන පාඨමාලා | **11** |
| **2 වාරය: අප්‍රේල්-අගෝස්තු** | |
| කාල සටහන | **14** |
| උදෑසන සහ දහවල් පැවැත්වෙන පාඨමාලා | **15 – 17** |
| සවස පැවැත්වෙන පාඨමාලා | **17 – 18** |
| **3 වාරය: සැප්තැම්බර්-නොවැම්බර්** | |
| කාල සටහන | **20** |
| උදෑසන සහ දහවල් පැවැත්වෙන පාඨමාලා | **21 – 23** |
| සවස පැවැත්වෙන පාඨමාලා | **23 – 25** |
| **කථිකාචාර්යවරුන්ගේ විස්තර** | **26 – 29** |
| **CTS පාඨමාලා විස්තර** | **30** |
| **ළමා සේවා ක්ෂේත්‍රය** | **31 – 32** |

# පොදු තොරතුරු

**CTS පාඨමාලා:**

- CTS නියමානුකූල පාඨමාලාවක් සාමාන්‍යයෙන් පවත්වන්නේ සතියකට පන්තියක් බැගින් සති 13ක කාලයක් පුරාය.
- කෙටිකාලීන පාඨමාලා සම්පූර්ණ දින 4ක් පුරා පැවැත්වෙන කඩිනම් අධ්‍යයන පාඨමාලා වේ.
- බොහෝ පාඨමාලාවන්හි පන්තිය තුළ ගත කරන කාලයේ එකතුව පැය 24ක් වුවත් ඇතැම් ඒවායේ පැය 36ක මුළු එකතුවක් තිබිය හැකිය. එසේ නැතහොත් පැය 24ක පන්ති කාමර කාලයක්ද පැය 12ක ප්‍රායෝගික ක්‍රියාකාරකම් කාලයක්ද ඇත.

**පාඨමාලා දේශන පැවැත්වීම:**

- **පන්ති කාමරය තුළ:** පාඨමාලාව CTS කොහුවල පරිශ්‍රයේදී ඉගැන්වේ.
- **අන්තර්ජාලය හරහා:** පාඨමාලාව Zoom හරහා ඉගැන්වෙන අතර අදාළ සටහන් Moodle තුළින් ලබා ගත හැකිය. ඔබට වේගවත් අන්තර්ජාල සම්බන්ධතාවක් හා ඩිජිටල් උපාංගයක් අවශ්‍ය වනු ඇත.
- **මිශ්‍ර ශික්ෂණ මාධ්‍ය:** පාඨමාලාව පන්ති කාමරය තුළ හා අන්තර්ජාලය හරහා ඉගැන්වේ. ඇතැම් සතිවල ඔබගේ පන්තිය CTS කොහුවල පරිශ්‍රයේදී පැවැත්වෙන අතර අනෙක් සතිවල අන්තර්ජාලය හරහා ඉගැන්වෙනු ඇත. සැලැස්ම පිළිබඳ ඔබගේ කථිකාචාර්යවරයා පාඨමාලාව ආරම්භයේදී ඔබට දැනුම් දෙනු ඇත.

**CTS පාඨමාලා ගාස්තු:**

පාඨමාලාවක් හඳුන්වාදීමේ ගාස්තුව රු. 7000/- කි.

** කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ පාඨමාලා සහනදායි මිලකට සිසුන්ට සැපයීමට හැකිව ඇත්තේ එය සේවයේ මිතුරන්ගේ නොමසුරු මුල්‍ය පරිත්‍යාගශීලිත්වය නිසා බැව් අපි කෘතඥතා පූර්වකව සිහිපත් කරමු. මෙම සුවිශේෂී සැපයුමේ යහපත් ගබඩාකරුවන් වීම සිසුන්ගෙන් අපේක්ෂා කෙරේ.*

**පාඨමාලා සඳහා CTSහි ලියාපදිංචි වන ආකාරය:**

ලියාපදිංචි වීමේ අයදුම් පත https://www.cts.lk/online-registration/ සම්පූර්ණ කරන්න. ගෙවීම් අන්තර්ජාලය හරහා https://www.cts.lk/payment/, බැංකු හුවමාරු තුළින්, හෝ ක්‍රෙඩිට් කාඩ් තුළින් කළ හැකිය.

***සැලකිය යුතුයි:*** *පන්තියක ඔබගේ ස්ථානය වෙන්කරනු ලබන්නේ ඔබ පාඨමාලාව සඳහා සම්පූර්ණ ගෙවීම කළ පසුවය.*

**වැදගත්:** පළමු වරට පාඨමාලාවක් සඳහා ලියාපදිංචි වන්නන්
ඔබගේ සභාපාලකතුමාගෙන් නිර්දේශ ලිපියක් රැගෙන ආ යුතුය.

**ලියාපදිංචි විය හැකි දින හා වේලාවන්:**

යම් වාරයක පාඨමාලා සඳහා ලියාපදිංචි විය හැක්කේ එම වාරය ආරම්භ වන දින දක්වා පමණි.

***පළමු වාරය: 2025 ජනවාරි 6***

***දෙවන වාරය: 2025 අප්‍රේල් 28***

***තෙවන වාරය: 2025 සැප්තැම්බර් 1***

# 1 වාරය

# 2025 ජනවාරි 6 - අප්‍රේල් 5

○ පන්ති කාමරය තුළ | □ අන්තර්ජාලය හරහා | ★ මිශ්‍ර ශික්ෂණ මාධ්‍ය

# කාල සටහන - 1 වන වාරය

| වේලාව | සඳුදා | අඟහරුවාදා | බදාදා | බ්‍රහස්පතින්දා | සිකුරාදා | සෙනසුරාදා |
|---|---|---|---|---|---|---|
| උදෑසන | ○ **බහුත්ව සමාජයක ධර්මදූත සේවය**<br>පෙ.ව.9:00-පෙ.ව.11:30<br>සුරංග අතුකෝරාළ | ○ **මතෙව් තුමාගේ පොත**<br>පෙ.ව.9:00-පෙ.ව.11:30<br>සනත් අතුකෝරාළ | ○ **රෝම පොත**<br>පෙ.ව.9:00-ප.ව.12:30<br>රවින් කල්දේරා<br>සහභාගිකමේ කාලය<br>පෙ.ව.10:30-පෙ.ව.11:30 | ○ **ශ්‍රී ලංකා සභා ඉතිහාසය**<br>පෙ.ව.9:00-ප.ව.12:30<br>ජී පී වී සෝමරත්න \| මධු මිහිරි ප්‍රනාන්දු<br>දේව මෙහෙය<br>පෙ.ව.10:30-පෙ.ව.11:30 | ○ **ක්‍රිස්තු ශාසනයේ ඉතිහාසය III**<br>පෙ.ව.9:00-පෙ.ව.11:00<br>ජී පී වී සෝමරත්න \| මධු මිහිරි ප්‍රනාන්දු \| මිශෙල් පීරිස් | |
| දහවල් | ○ **විවාහය කිතුනු දෘෂ්ටිකෝණයකින් දැකීම**<br>ප.ව.3:00-ප.ව.5:15<br>මහින්ද මුණසිංහ | ○ **බයිබලීය අර්ථකථනය**<br>ප.ව.3:00-ප.ව.5:30<br>ඊන්ස්ටීන් ප්‍රනාන්දු | ○ **නායකත්වය**<br>ප.ව.3:00-ප.ව.5:15<br>සරත් ද සිල්වා | ○ **පොදු ගැටලු සඳහා උපදේශනය**<br>ප.ව.3:00-ප.ව.5:15<br>ඊන්ස්ටීන් ප්‍රනාන්දු | ○ **මුදල්, වස්තුව සහ දේවරාජ්‍යය**<br>ප.ව.3:00-ප.ව.5:00<br>බෙනිසි සිල්වා | කෙටි කාලීන<br>ජනවාරි<br>15-16-17-20 |
| සවස | ○ **බයිබලීය දේවධර්මය**<br>ප.ව.6:00-ප.ව.8:15<br>සරත් ද සිල්වා | ○ **බයිබලීය භාෂා සඳහා ප්‍රවේශය**<br>ප.ව.6:00-ප.ව.8:30<br>රවින් කල්දේරා | ○ **නව ගිවිසුමට හැඳින්වීමක්**<br>ප.ව.6:00-ප.ව.8:15<br>චමිලා සුභාෂ් රණසිංහ | □ **සභාව සහ අවසන් කාලය**<br>ප.ව.6:00-ප.ව.8:15<br>සනත් අතුකෝරාළ | □ **කිතුනු ධර්මනියාමක ඉතිහාසය**<br>ප.ව.6:00-ප.ව.8:00<br>රවින් කල්දේරා | ○ **පීඩා විඳීම පිළිබඳ දේවවේදය සහ ශ්‍රාවකත්වය**<br>පෙ.ව.9:00-ප.ව.4:00<br>සරත් ද සිල්වා \| මනෝජ් පීරිස් |

*නොවැළැක්විය හැකි හේතු මත ප්‍රකාශිත කාල සටහන වෙනස් විය හැකිය. ලියාපදිංචි වීමට පෙර අධ්‍යයන කාර්යාලයෙන් විමසන්න.*

## 1 වන වාරය | 2025 ජනවාරි 6 - අප්‍රේල් 5

# උදෑසන සහ දහවල් කාලයේ පැවැත්වෙන පාඨමාලා

## පන්ති කාමරය තුළ

### බහුත්ව සමාජයක ධර්මදූත සේවය

**BTh|Dip අනිවාර්ය**

ගැළවීමට එකම මාර්ගය යේසුස් ක්‍රිස්තුස් වහන්සේද? විකල්ප නොසලකා උඩගු පණිවිඩයක් වෙනත් ආගම් ලබ්ධිකයින් හා වෙනත් ජීවන රටා අනුව ජීවත් වන අයට ප්‍රකාශ කළ හැකිද? මෙම පාඨමාලාව ශුභාරංචියේ හදවත වෙතට ඔබ කැඳවාගෙන යන අතර බහුත්වාදී සමාජයක යේසුස් ක්‍රිස්තුස් වහන්සේ අන් අයට හඳුන්වා දීම ඵලදායී ලෙස කිරීමට ඔබට මග පෙන්වයි.

සති 10
දිනය: සඳුදා
වේලාව: පෙ.ව. 9:00-11:30
ආරම්භය: ජනවාරි 20
සම්මාන: 2
කථිකාචාර්ය: **සුරංග අතුකෝරාළ**

### විවාහය කිතුනු දෘෂ්ටිකෝණයකින් දැකීම

**BTh|Dip වෛකල්පික**

කිතුනුවකුගේ ජීවිතයේ ඉතාම තීරණාත්මක සිදුවීමක් වන්නේ විවාහයයි. විවාහය පිළිබඳ බයිබලීය දැක්ම තුළින් මතුවන පෙම් ඇසුර, භූමිකාවන් හා වගකීම් සහ විවාහය තුළ ඇති මිත්‍රත්වය වැනි මාතෘකා මෙහිදී සාකච්ඡා කෙරේ. එසේම මුදල් කළමනාකරණය, දරුපල නොමැතිකම, අපයෝජනකාරී සහකරු, ලිංගික ද්‍රෝහිකම සහ දික්කසාදය වැනි අභියෝගයන්ද එහිදී සාකච්ඡා කෙරේ.

සති 11
දිනය: සඳුදා
වේලාව: ප.ව. 3:00-5:15
ආරම්භය: ජනවාරි 6
සම්මාන: 2
කථිකාචාර්ය: **මහින්ද මුණසිංහ**

### මතෙව් තුමාගේ පොත

**BTh අනිවාර්ය**
**Dip වෛකල්පික**

ග්‍රීක ලේඛන කලාවේ ශුභාරංචි ශෛලීය අද්විතීය වේ. ශුභාරංචි සතරේ සෑම එකකටම ඊට ආවේණික වූ හඬක් ඇත. මෙම පාඨමාලාව තුළ දී මතෙව් ශුභාරංචියේ ප්‍රධාන ලක්ෂණ විමසා බලනු ඇත. ඒවා අතර දේව රාජ්‍යය පිළිබඳ මූලික තේමාව, කන්ද උඩ දේශනාව සහ යේසුස් වහන්සේගේ අනෙකුත් ඉගැන්වීම්, කැපී පෙනෙන උපමා කථා, එහි ව්‍යුහය සහ එහි ධර්මදූත පණිවුඩය වන්නේය.

සති 10
දිනය: අඟහරුවාදා
වේලාව: පෙ.ව. 9:00-11:30
ආරම්භය: ජනවාරි 7
සම්මාන: 2
කථිකාචාර්ය: **සනත් අතුකෝරාළ**

### බයිබලීය අර්ථකථනය

**BTh|Dip අනිවාර්ය**

බයිබලය සෑම පරම්පරාවක් උදෙසා වන දෙවියන් වහන්සේගේ නොවෙනස්වන වචනය බව කිතුනුවන්ගේ පිළිගැනීමයි. එහෙත් බයිබලය අර්ථකථනය කර එහි සත්‍ය නියමාකාරයෙන් උකහා ගැනීම අපට ඇති අභියෝගයයි. මෙම පාඨමාලාව තුළින් බයිබලයේ ඇති විවිධ සාහිත්‍ය පොත්: උදා. කාව්‍යමය, කථාන්දර, අනාගත වාක්‍ය සහ ව්‍යවස්ථාව අර්ථකථනය කිරීමට ඇවැසි මූලධර්ම සපයයි.

සති 10
දිනය: අඟහරුවාදා
වේලාව: ප.ව. 3:00-5:30
ආරම්භය: ජනවාරි 7
සම්මාන: 2
කථිකාචාර්ය: **ඊන්සිටීන් ප්‍රනාන්දු**

## 1 වන වාරය | 2025 ජනවාරි 6 - අප්‍රේල් 5

# උදෑසන සහ දහවල් කාලයේ පැවැත්වෙන පාඨමාලා

## පන්ති කාමරය තුළ

### රෝම පොත

අගෝස්තීන්, මාටින් ලූතර්, ජෝන් වෙස්ලි සහ කාල් බාත් යන අයගේ ජීවිත වල ගැඹුරු පරිවර්තනයකට මුල පිරූ පොතකි. ඉශ්‍රායෙල් ජාතියට හා සමස්ථ මැවිල්ලට දෙවිඳුන්ගේ මිදීමේ සැලැස්ම පාවුල් තුමා දක්වමින්, කුරුසිය තුළින් ප්‍රේමය හා සාධාරණත්වය පරිපූර්ණ කළ අයුරු මතුකරයි. මෙම පොත අධ්‍යයනය කිරීම තුළින් ඔබේ ජීවිතය ද පරිවර්තනය වනු නොඅනුමානය.

**BTh අනිවාර්ය**
**Dip වෛකල්පික**

සති 11

දිනය: බදාදා

වේලාව: පෙ.ව. 9:00-ප.ව. 12:30

ආරම්භය: ජනවාරි 8

සම්මාන: 2

කථිකාචාර්ය: **රවින් කල්දේරා**

### නායකත්වය

*බයිබලයෙන් නායකත්වය ඉගෙනීම*

නායකත්වය පිළිබඳ විවිධ අදහස්වලින් සමාජය පිරී ඇත. කිතුනුවන් වන අප බයිබලයට අනුකූල නායකත්ව ප්‍රතිපත්ති ඉගෙන ගන්නේ කෙලෙසද? මෙම පාඨමාලාව ඔබගේ සේවය තුළ, රැකියා ස්ථානය තුළ, නිවස තුළ ඵලදායි ලෙස නායකත්වය දීමට මග පාදනු ඇත.

**BTh|Dip අනිවාර්ය**

සති 11

දිනය: බදාදා

වේලාව: ප.ව. 3:00-5:15

ආරම්භය: ජනවාරි 8

සම්මාන: 2

කථිකාචාර්ය: **සරත් ද සිල්වා**

### ශ්‍රී ලංකා සභා ඉතිහාසය

ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි උරුමය හැදෑරීමට අපූරු අවස්ථාවකි. ලංකාව තුළ කිතුනු දහමේ ආරම්භය, පෘතුගීසීන්, ලන්දේසීන්, බ්‍රිතාන්‍යයන් හා ඇමෙරිකානු බලපෑම් තුළින් ක්‍රිස්තියානි සභාව හැඩ ගැසී වත්මන් සභාවේ විවිධත්වය ඇතිවූ ආකාරය ගවේෂණය කෙරේ.

**BTh|Dip අනිවාර්ය**

සති 11

දිනය: බ්‍රහස්පතින්දා

වේලාව: පෙ.ව. 9:00-ප.ව. 12:30

ආරම්භය: ජනවාරි 9

සම්මාන: 2

කථිකාචාර්ය: **ජී පී වී සෝමරත්න | මධු මිහිරි ප්‍රනාන්දු**

### පොදු ගැටලු සඳහා උපදේශනය

දුක, ශෝකය, මානසික අසහනය, කාංසාව, හීනමානය, කේන්තිය, ඇබ්බැහිවීම් යනාදී දහසකුත් ප්‍රශ්නවල සමාජය ගිලී ඇත. මෙම ප්‍රශ්න ක්‍රිස්තියානි පවුල්වලට ද බලපායි. මෙවැනි වාතාවරණයක ගිලී සිටින පිරිසට අත්වැලක් වීමට අවශ්‍ය නිපුණතාව ඔබට ලැබෙනු ඇත.

**BTh|Dip වෛකල්පික**

සති 11

දිනය: බ්‍රහස්පතින්දා

වේලාව: ප.ව. 3:00-5:15

ආරම්භය: ජනවාරි 9

සම්මාන: 2

කථිකාචාර්ය: **ඊන්ස්ටීන් ප්‍රනාන්දු**

## 1 වන වාරය | 2025 ජනවාරි 6 - අප්‍රේල් 5

# උදෑසන, දහවල් සහ සවස් කාලයේ පැවැත්වෙන පාඨමාලා

## පන්ති කාමරය තුළ

### ක්‍රිස්තු ශාසනයේ ඉතිහාසය III

*20 වන ශතවර්ෂය*

විසිවන සියවස ක්‍රිස්තියානි ශාසනයට ඉතා වැදගත් ය. පෙන්තකොස්ත ප්‍රගමනය, සාමයික ප්‍රගමනය, ශීතල යුද්ධය අතර බෙදුණු ලෝකයේ ක්‍රිස්තියානි සභාව, දෙවන වතිකානු සම්මේලනය වැදගත් ප්‍රවණතා වේ. මෙම ප්‍රවණතා හැදෑරීම තුළින් ඔබට වඩා බලපෑමක් ඇති කළ හැකි ගෝලීය කිතුනුවෙකු විය හැකිය.

**BTh|Dip අනිවාර්ය**

සති 12

දිනය: සිකුරාද

වේලාව: පෙ.ව. 9:00-11:00

ආරම්භය: ජනවාරි 10

සම්මාන: 2

කථිකාචාර්ය: **ජේ පී වී සෝමරත්න | මධු මිහිරි ප්‍රනාන්දු | මිශෙල් පීරිස්**

### මුදල්, වස්තුව සහ දේවරාජ්‍යය

*බයිබලීය භාරකාරත්වය ඉගෙනීම*

මුදල්, ඉතිරිකිරීම්, ආයෝජනය, ණය, දීම, ‘සමෘද්ධිමත් ශුභාරංචිය’, තපස්කම සහ ස්වර්ගීය විපාක යන මාතෘකාවන්ට අදළ දේව වචනයේ පාඨ මෙම පාඨමාලාව තුළින් හඳරනු ලැබේ. ඔබගේ ජීවිතයේ සදතනයටම බලපාන භාරකාරීත්වය පිළිබඳ බයිබලීය දැක්මක් ඇති කරලීම මෙහි අරමුණයි.

**BTh|Dip වෛකල්පික**

සති 12

දිනය: සිකුරාද

වේලාව: ප.ව. 3:00-5:00

ආරම්භය: ජනවාරි 10

සම්මාන: 2

කථිකාචාර්ය: **බෙනිසි සිල්වා**

### බයිබලීය දේවධර්මය

පැරණි ගිවිසුමේ සහ නව ගිවිසුමේ ලියවිලි වට කොට ඇති ප්‍රධාන දේවධර්මය මෙම පාඨමාලාවෙන් හඳරනු ලැබේ. දෙවියන් වහන්සේ යනු කවුද? මුල් මැවිල්ලේ සිට නව මැවිල්ල දක්වා උන් වහන්සේගේ අද්විතීය සැලැස්ම දිගහැරෙන ආකාරය පිළිබඳ ඔබගේ දැනුම තියුණු කරනු ඇත.

**BTh අනිවාර්ය**
**Dip වෛකල්පික**

සති 11

දිනය: සඳුද

වේලාව: ප.ව. 6:00-8:15

ආරම්භය: ජනවාරි 6

සම්මාන: 2

කථිකාචාර්ය: **සරත් ද සිල්වා**

### බයිබලීය භාෂා සඳහා ප්‍රවේශය

කිතුනු ශුද්ධ ලියවිල්ල මුලින් ලියවී ඇත්තේ හෙබ්‍රෙව්, ඇරමික් හා ග්‍රීක් යන භාෂාවන් ගෙන් ය. එහෙත් අප කියවන්නේ පරිවර්තනයන් හෝ අනුවාදයන් ය. භාෂාවකට ආවේනික සංස්කෘතිය තුළ අර්ථයන් සන්නිවේදනය වන නිසා කිතුනුවන් බයිබලීය භාෂාවන් ගේ තාක්ෂණය ගැන දැන සිටීම වැදගත් ය. මෙම පාඨමාලාව තුළින් හෙබ්‍රෙව් හා ග්‍රීක් භාෂා පිළිබඳ මූලික ප්‍රවේශයක් ලබා දීමට උත්සහ දැරේ.

**BTh|Dip වෛකල්පික**

සති 10

දිනය: අඟහරුවාද

වේලාව: ප.ව. 6:00-8:30

ආරම්භය: ජනවාරි 7

සම්මාන: 2

කථිකාචාර්ය: **රවින් කල්දේරා**

## 1 වන වාරය | 2025 ජනවාරි 6 - අප්‍රේල් 5
# සවස් කාලයේ පැවැත්වෙන පාඨමාලා
### පන්ති කාමරය තුළ

## නව ගිවිසුමට හැඳින්වීමක්

**BTh|Dip අනිවාර්ය**

නව ගිවිසුමේ පොත් තෝරා ගත් ආකාරය හා ඒවා පිළියෙල කළ ආකාරය ඉගෙන ගත හැකිය. නව ගිවිසුමේ සෑම පොතකම අඩංගු ප්‍රධාන පණිවිඩය හා එහි කර්තෘත්වය, නව ගිවිසුමේ පොත් සභාවට පළමු වතාවට ලැබුණු විට සිදුවුණු දේ පිළිබඳ ගවේෂණය කළ හැකිය. නව ගිවිසුම් සාහිත්‍ය පිළිබඳ පුළුල් අවබෝධයක් මෙම පාඨමාලාවෙන් ඔබට ලැබේ.

සති 11

දිනය: බදාදා

වේලාව: ප.ව. 6:00-8:15

ආරම්භය: ජනවාරි 8

සම්මාන: 2

කථිකාචාර්ය: **චමිලා සුභාෂ් රණසිංහ**

## 1 වන වාරය | 2025 ජනවාරි 6 - අප්‍රේල් 5
# සවස් කාලයේ පැවැත්වෙන පාඨමාලා
### අන්තර්ජාලය හරහා

## සභාව සහ අවසන් කාලය

**BTh අනිවාර්ය**
**Dip වෛකල්පික**

සභාව යනු කුමක්ද? සභාව ලෙස අදහස් කෙරෙනුයේ ගොඩනැගිල්ලක්ද සම්ප්‍රදායක්ද නැතිනම් නමස්කාරයක්ද? අප හඳුනන ලෝකය අවසන් වන්නට යන්නේ කෙසේද? මෙම පාඨමාලාව හැදෑරීමෙන් සභාවේ ක්‍රියාකාරීවීමටද අවසන් කාලය, ස්වර්ගය හා නිරය පිළිබඳ වැදගත් අවබෝධයක්ද ඔබට ලැබෙනු ඇත.

සති 11

දිනය: බ්‍රහස්පතින්දා

වේලාව: ප.ව. 6:00-8:15

ආරම්භය: ජනවාරි 9

සම්මාන: 2

කථිකාචාර්ය: **සනත් අතුකෝරාළ**

## කිතුනු ධර්මනියාමක ඉතිහාසය

**BTh|Dip වෛකල්පික**

කිතුනු දහම යනුවෙන් හැඳින්වෙන්නේ ඓතිහාසික සිදුවීමක් ඇසුරින් වූ දේවධර්ම චින්තාවන් තුළින් ගොඩ නැගුණු ධර්මයක් හා ඒ හා සැබෑදී ජීවිත රටාවකි. ක්‍රිස්තුන් වහන්සේ විසින් උදාකළ විමුක්තිය චින්තනාත්මක ලෙස අදාළ කිරීමට උත්සාහයක් හැම කාලයකම සිදුවිය. මෙම පාඨමාලාව මගින් අධ්‍යයනය කරන්නේ, එසේ ගත් උත්සාහයන් තුළින් මතුවූ කිතුනු චින්තාව හා භක්තිය සබැඳි ජීවිතයෙන් ගොඩ නැගුණු කිතුනු ධර්ම නියාමකයන්ය.

සති 12

දිනය: සිකුරාදා

වේලාව: ප.ව. 6:00-8:00

ආරම්භය: ජනවාරි 10

සම්මාන: 2

කථිකාචාර්ය: **රවින් කල්දේරා**

## 1 වන වාරය | 2025 ජනවාරි 6 - අප්‍රේල් 5

# කෙටි කාලීන පාඨමාලා

## පන්ති කාමරය තුළ

| | |
|---|---|
| **පීඩා විඳීම පිළිබඳ දේවවේදය සහ ශ්‍රාවකත්වය**<br>කිතුනු ජීවිතය තුළ දුක් පීඩාවන් අමුතුම අත්දැකීමක් නොවේ. කිතුනු ශ්‍රාවකත්වය තුළ දුක් පීඩා හා දුක් ගැහැට සඳහා සාධනීය ලෙස මුහුණ දීමට අවශ්‍ය දේවධාර්මික පදනම සැපයීම කරයි. | කෙටි කාලීන **BTh\|Dip වෛකල්පික**<br>ජනවාරි මාසයේ දින 4ක්<br>දින: 15-16-17-20<br>වේලාව: පෙ.ව. 9:00-ප.ව.4:00<br>සම්මාන: 2<br>කථිකාචාර්ය: **සරත් ද සිල්වා \| මනෝජ් පීරිස්** |

# 2 වාරය

# 2025 අප්‍රේල් 28 - අගෝස්තු 2

○ පන්ති කාමරය තුළ | □ අන්තර්ජාලය හරහා | ★ මිශ්‍ර ශික්ෂණ මාධ්‍ය

# කාල සටහන - 2 වන වාරය

| වේලාව | සඳුදා | අඟහරුවාදා | බදාදා | බ්‍රහස්පතින්දා | සිකුරාදා |
|---|---|---|---|---|---|
| උදෑසන | ○ **ඉශ්‍රායෙල් ඉතිහාසය**<br>පෙ.ව.9:00-පෙ.ව.11:30<br>ජී පී වී සෝමරත්න | ○ **බිඳුණු උද්වේගයට සුවය**<br>පෙ.ව.9:00-පෙ.ව.11:30<br>ඊන්ස්ටීන් ප්‍රනාන්දු | ○ **ළමා උපදේශනය**<br>පෙ.ව.9:00-ප.ව.12:30<br>ක්‍රිස්නි එදිරිසිංහ<br>සහභාගිකමේ කාලය<br>පෙ.ව.10:30-පෙ.ව.11:30 | ○ **ක්‍රිස්තියානි ලෝකදෘෂ්ටියක් වර්ධනය කිරීම**<br>පෙ.ව.9:00-ප.ව.12:30<br>මනෝජ් පීරිස්<br>දේව මෙහෙය<br>පෙ.ව.10:30-පෙ.ව.11:30 | ○ **එපිසවරුන්ට යැවූ හසුන**<br>පෙ.ව.9:00-පෙ.ව.11:00<br>බෙනිසි සිල්වා |
| දහවල් | ○ **උන් වහන්සේ කව්රුන්ද?**<br>ප.ව.3:00-ප.ව.5:15<br>රවින් කල්දේරා \|<br>නිශාන්ත ගුණසේකර | ○ **දූතනය පිළිබඳ දේවධර්මය**<br>ප.ව.3:00-ප.ව.5:30<br>සනත් අතුකෝරාළ | ○ **කොරින්තියේ සිට කොළඹට**<br>ප.ව.3:00-ප.ව.5:00<br>ෂර්ලි ෆේබර් | ○ **උපදේශනයට හැඳින්වීම**<br>ප.ව.3:00-ප.ව.5:30<br>ඊන්ස්ටීන් ප්‍රනාන්දු | ○ **ගීතාවලිය ගවේෂණය කිරීම**<br>ප.ව.3:00-ප.ව.5:00<br>දුලිප් ප්‍රනාන්දු |
| සවස | ○ **සේවය තුළ මුල්‍යමය ස්වරත්වය හා විශ්වාසනීයත්වය**<br>ප.ව.6:00-ප.ව.8:15<br>සුරංග අතුකෝරාළ | □ **නික්මයාමේ සිට ද්විතීය කථාව දක්වා**<br>ප.ව.6:00-ප.ව.8:30<br>මහින්ද මුණසිංහ | ○ **එඬේර රැකවරණය**<br>ප.ව.6:00-ප.ව.8:00<br>සරත් ද සිල්වා | ○ **යෞවන යෞවනියන් සඳහා සේවය**<br>ප.ව.6:00-ප.ව.8:30<br>නාමල් වීරසිංහ | □ **ආමොස් පොත**<br>ප.ව.6:00-ප.ව.8:00<br>දිලිප් ගුණවීර |

*නොවැළැක්විය හැකි හේතු මත ප්‍රකාශිත කාල සටහන වෙනස් විය හැකිය. ලියාපදිංචි වීමට පෙර අධ්‍යයන කාර්යාලයෙන් විමසන්න.*

## 2 වන වාරය | 2025 අප්‍රේල් 28 - අගෝස්තු 2
# උදෑසන සහ දහවල් කාලයේ පැවැත්වෙන පාඨමාලා
## පන්ති කාමරය තුළ

### ඉශ්‍රායෙල් ඉතිහාසය
පැරණි ගිවිසුම සැබෑ ඓතිහාසික පසුබිම මත ගොඩ නැගී ඇත. ආබ්‍රහම් සිට බාර්-කොක්බා කැරැල්ල දක්වා සිටි ශ්‍රේෂ්ඨ පුද්ගලයින් සහ සිද්ධීන් ගැන ඉගෙන ගන්නා අතරම යුදෙව් ඉතිහාසය තුළ බයිබලය හැදෑරීමට මෙම පාඨමාලාව ඔබට අවස්ථාව ලබා දෙයි.

සති 10 | **BTh|Dip වෛකල්පික**

දිනය: සඳුදා

වේලාව: පෙ.ව. 9:00-11:30

ආරම්භය: මැයි 5

සම්මාන: 2

කථිකාචාර්ය: **ජී පී වී සෝමරත්න**

### උන් වහන්සේ කව්රුන්ද?
*උන් වහන්සේ වැදගත් වන්නේ ඇයි?*

චතාරික කාලයේදී යේසුස් වහන්සේගේ දුක් ගාවිනාව ගැන අපි මෙනෙහි කරන්නෙමු. මෙම පාඨමාලාවේදී දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් වූ යේසුස් වහන්සේගේ මනුෂ්‍යාත්වය ගැන විමසා බැලෙනු ඇත. උන් වහන්සේ දෙවියන් වහන්සේට හා මිනිසුන්ට සබැඳිතාව, උන් වහන්සේගේ මෙහෙවර හා උන් වහන්සේගේ ගාවිනාව ගැන ශුභාරංචි පොත් ආශ්‍රිතව විමසා බැලෙනු ඇත.

සති 11 | **BTh|Dip වෛකල්පික**

දිනය: සඳුදා

වේලාව: ප.ව. 3:00-5:15

ආරම්භය: අප්‍රේල් 28

සම්මාන: 2

කථිකාචාර්ය: **රවින් කල්දේරා | නිශාන්ත ගුණසේකර**

### බිඳුණු උද්වේගයට සුවය
මිනිසා උද්වේගයන්ගෙන් පිරී අයෙකි. ඒවා නිවැරදි ලෙස අනාවරණය නොකළහොත් පසු කලෙක දිවියට හානි පමුණුවන රෝගී තත්වයක් බවට පත්වීමට ඉඩ ඇත. එම තත්ත්ව සැඟවුණු බැවින් හඳුනා ගැනීමට ඉතා අපහසුය. මානසික හා ආත්මික වර්ධනයට බාධා පමුණුවයි. එවැනි උද්වේග අවබෝධ කරගෙන කිතුනු දිවිය ගත කිරීමට මෙම පාඨමාලාව මහත් උපකාරයක් වනු නොඅනුමානය.

සති 10 | **BTh|Dip වෛකල්පික**

දිනය: අඟහරුවාදා

වේලාව: පෙ.ව. 9:00-11:30

ආරම්භය: අප්‍රේල් 29

සම්මාන: 2

කථිකාචාර්ය: **ඒන්ස්ට්න් ප්‍රනාන්දු**

### දූතනය පිළිබඳ දේවධර්මය
දූතනය බයිබලය පුරා පැතිරී ඇති මාතෘකාවකි. ලෝකය පිළිබඳ දෙවියන් වහන්සේගේ කැමැත්ත උත්පත්ති 1 හි එළිදරව් කර ඇති අතර ලොවට ගැළවීම ගෙනෙන පොරොන්දුවක් උත්පත්ති 3 හි සඳහන් වී ඇත. ධර්මදූතනයේ තේමාව සොයා යෑමේදී ආබ්‍රහම්ගේ කැඳවීම, ඉශ්‍රායලයේ කැඳවීම, යේසුස් වහන්සේගේ දූතනය, ක්‍රියා පොත මගින් ගෙනෙන දයකත්වය වැනි මාතෘකා මෙම පාඨමාලාවේදී හඳුනා ලැබේ.

සති 10 | **BTh|Dip වෛකල්පික**

දිනය: අඟහරුවාදා

වේලාව: ප.ව. 3:00-5:30

ආරම්භය: අප්‍රේල් 29

සම්මාන: 2

කථිකාචාර්ය: **සනත් අතුකෝරාළ**

# උදෑසන සහ දහවල් කාලයේ පැවැත්වෙන පාඨමාලා

## පන්ති කාමරය තුළ

### ළමා උපදේශනය

BTh|Dip වෛකල්පික

වත්මන් සමාජය තුළ වැඩිහිටියන් මෙන්ම දරුදැරියෝ ද බොහෝ ප්‍රශ්නවලට මුහුණ දෙති. ඔවුන් උදෙසා උපකාර කිරීමේ ආශාවක් බොහෝ දෙනෙකුට ඇති නමුත්, නිවැරදිව උපදේශනය කරන්නේ කෙසේදැයි නොදනිති. ළමා උපදේශනය නම් වූ මෙම විෂය ළමා වර්ධනය, මානසිකත්වය හා පරිසරය ආශ්‍රිත තේමා පිළිවෙළින් හා න්‍යායාත්මකව හැදෑරීමට මෙමගින් අවකාශ සැලසේ.

සති 12

දිනය: බදදා

වේලාව: පෙ.ව. 9:00-ප.ව. 12:30

ආරම්භය: අප්‍රේල් 30

සම්මාන: 2

කථිකාචාර්ය: **ක්‍රිස්නි එදිරිසිංහ**

### කොරින්තියේ සිට කොළඹට

BTh|Dip වෛකල්පික

*කොරින්තිවරුන්ට ලියන ලද පළමු හසුන*

මෙම පාඨමාලාවේ දී, කොරින්ති සභාවේ තිබූ අර්බුදවලට වූ විසඳුම් සමකාලීන නාගරික ක්‍රිස්තියානියට අදාළ කිරීමේ අරමුණ ඇතිව 1 කොරින්ති හසුන අධ්‍යයනය කෙරේ. සභාව තුළ බෙදීම්, ඇදහිලිවන්තයන් අතරේ නඩුකීම්, සභා විනය, දික්කසාදය, කිතුනු නිදහස සහ ආත්මික දීමනා වැනි මාතෘකා සාකච්ඡා කරනු ඇත.

සති 12

දිනය: බදදා

වේලාව: ප.ව. 3:00-5:00

ආරම්භය: අප්‍රේල් 30

සම්මාන: 2

කථිකාචාර්ය: **ෂර්ලි ෆේබර්**

### ක්‍රිස්තියානි ලෝකදෘෂ්ටියක් වර්ධනය කිරීම

BTh|Dip අනිවාර්ය

"ලෝක දැක්ම කණ්නාඩි කුට්ටමක් වැනි ය. අපට පෙනෙන දෙය නොව, අප කුමක් තුළින් දකින්නේද යන්න විස්තර කෙරේ" (පෝල් හීබර්ට්). මෙම පාඨමාලාව අපගේ සිතුම් සහ ආකල්ප ඇගයීමට ලක් කිරීමේ වැදගත්කම පහදයි. මේ ලෝකයේ ක්‍රමයට අනුරූප නොවී ඔබගේ සිතිවිලි සහ චින්තනය නිදහස්ව තබා ගැනීමට ඉවහල් වන බලපෑමක් මෙම පාඨමාලාවෙන් ඔබට ලැබෙනු ඇත.

සති 10

දිනය: බ්‍රහස්පතින්දා

වේලාව: පෙ.ව. 9:00-ප.ව. 12:30

ආරම්භය: මැයි 8

සම්මාන: 2

කථිකාචාර්ය: **මනෝජ් පීරිස්**

### උපදේශනයට හැඳින්වීම

BTh|Dip අනිවාර්ය

මානසික සහ චිත්තවේගී සහනය අවශ්‍යව සිටින්නාවූ පුද්ගලයන් අපට දෛනික ජීවිතයේදී මුණ ගැසේ. ඔවුන්ට උපකාර කරන පුද්ගලයෙකු ලෙස කිතුනුවෙකු සවිගත වන්නේ කෙසේද? උපදේශනය පිළිබඳ බයිබලීය ඉගැන්වීම් හැදෑරීම, අන් අයට උපකාර කිරීම සහ ඔවුන් පූර්ණත්වයට පත්කිරීමට අවශ්‍ය මූලික කුසලතා සම්බන්ධයෙන් හැඳින්වීමක් සිදු කෙරේ.

සති 10

දිනය: බ්‍රහස්පතින්දා

වේලාව: ප.ව. 3:00-5:30

ආරම්භය: මැයි 8

සම්මාන: 2

කථිකාචාර්ය: **ඊන්ස්ටින් ප්‍රනාන්දු**

## 2 වන වාරය | 2025 අප්‍රේල් 28 - අගෝස්තු 2

# උදෑසන, දහවල් සහ සවස් කාලයේ පැවැත්වෙන පාඨමාලා

## පන්ති කාමරය තුළ

### එපිසවරුන්ට යැවූ හසුන

එපිසවරුන්ට පාවුල් තුමා ලියූ හසුන "පාවුල් තුමාගේ පරමසාරය" ලෙස හඳුන්වනු ලබන්නේ සාරාංශයක් ලෙස ගත්කල එමඟින් ක්‍රිස්තුස් වහන්සේ ඔහුට භාරදුන් ශුභාරංචියේ හරය දැක්වෙන නිසාය. එපීස පොත දෙස කරන්නා වූ මෙම නැවුම් බැලීම තුළ ගැළවීම, සභාව හා කිතුනු ජීවිතය කෙරෙහි වූ ඔබේ දැක්ම පරිනාමනයකට ලක්වනු ඇත.

සති 12 **BTh|Dip වෛකල්පික**

දිනය: සිකුරාද

වේලාව: පෙ.ව. 9:00-11:00

ආරම්භය: මැයි 2

සම්මාන: 2

කථිකාචාර්ය: **බෙනිසි සිල්වා**

### ගීතාවලිය ගවේෂණය කිරීම

විලියම් වැන්ගැමරන් මෙසේ පවසයි: "ගීතාවලියේ කතුවරයා ආත්මයට ඔක්සිජන් සපයයි." ගීතාවලියේ වූ විවිධ ගීතිකා අර්ථකථනය කිරීම, වැලපීමෙන් දෙවියන් වහන්සේට කථා කරන ආකාරය, නමස්කාරය මෙන්ම දෙවියන් වහන්සේ පිළිබඳ විස්තරය ආදි දේ ඉශ්රායෙල් ගීතිකා පොත ගවේෂණය කිරීමෙන් ඉගෙන ගත හැකිය.

සති 12 **BTh|Dip වෛකල්පික**

දිනය: සිකුරාද

වේලාව: ප.ව. 3:00-5:00

ආරම්භය: මැයි 2

සම්මාන: 2

කථිකාචාර්ය: **දුලිප් ප්‍රනාන්දු**

### සේවය තුළ මූල්‍යමය ස්වරත්වය හා විශ්වාසනීයත්වය

සේවය තුළ මුහුණ දෙන ප්‍රධාන අභියෝගයක් වන්නේ මූල්‍ය කළමනාකරණය පිළිබඳ අභියෝගය යි. බොහෝ දේව සේවකයෝ මූල්‍යමය අස්ථාවරත්වයකින් පිඩා විඳිති; දෙවියන් වහන්සේ විසින් ලබා දෙනු ලබන සම්පත් නිර්මාණශීලි ලෙස කළමනාකරණය කිරීම, ආයෝජනය හා අරපිරිමැස්ම මගින් මූල්‍යමය ස්වරත්වයක් සඳහා අඩිතාලමක් දමා ගන්නේ කෙසේදැයි මෙම පාඨමාලාවෙන් ගවේෂණය කෙරේ.

සති 11 **BTh|Dip වෛකල්පික**

දිනය: සඳුද

වේලාව: ප.ව. 6:00-8:15

ආරම්භය: අප්‍රේල් 28

සම්මාන: 2

කථිකාචාර්ය: **සුරංග අතුකෝරාළ**

### එඩේර රැකවරණය

පරණ ගිවිසුමේ පටන් දේව සෙනඟට රැකවරණය සඳහා නායකයකු, එඩේරෙකු හෝ රැකවල්කරුවෙකු හෝ අවශ්‍ය බව පෙනේ. නායකයා සේවා අවශ්‍යතාවලදී එඩේර රැකවරණය සැලසීමට සූදානම්ව සිටිය යුතුවේ. මෙහිලා එඬේර රැකවරණ සේවාවන් විමසා බලන අතර, එයට ආත්මික පෝෂණය, බැහැදැකීම, විනය හා ප්‍රතිස්ථාපනය, බෞතීස්මය, මංගල්‍යය හා අවමංගල්‍ය අවස්ථාවලදී උපස්ථානය යන දෙය ද ඇතුළත්ය.

සති 12 **BTh|Dip වෛකල්පික**

දිනය: බදාද

වේලාව: ප.ව. 6:00-8:00

ආරම්භය: අප්‍රේල් 30

සම්මාන: 2

කථිකාචාර්ය: **සරත් ද සිල්වා**

## 2 වන වාරය | 2025 අප්‍රේල් 28 - අගෝස්තු 2

# සවස් කාලයේ පැවැත්වෙන පාඨමාලා

## පන්ති කාමරය තුළ

### යෞවන යෞවනියන් සඳහා සේවය

දෙවියන් වහන්සේගේ ශ්‍රේෂ්ඨ පැවරුම භූගෝලීය වශයෙන් පමණක් නොව පරම්පරාවෙන් පරම්පරාවටද ව්‍යාප්ත විය යුතුය. ගෝලීයකරණය වී ඇති ලෝකය තුළ තරුණ හඬ සහ ජවය මිනිස් සමාජයේ ස්වභාවය උඩු යටිකුරු කරමින් පවතී. දේව රාජ්‍යය සඳහා වූ තාරුණ්‍යයේ ජවය සභාව විසින් බොහෝ දුරට නොසලකා හැර ඇත. මෙම පාඨමාලාව යොවුන් වියේ ගැටලූ, නව යොවුන් වියේ අභියෝග මෙන්ම අවුරුදු 14 සිට 21 දක්වා තරුණ තරුණියන් ශුභාරංචියට නතු කරගෙන ශ්‍රාවකත්වයට ගොඩනගන්නේ කෙසේද යන්න ගවේෂණය කරයි.

BTh | Dip වෛකල්පික

සති 10

දිනය: බ්‍රහස්පතින්ද

වේලාව: ප.ව. 6:00-8:30

ආරම්භය: මැයි 8

සම්මාන: 2

කථිකාචාර්ය: **නාමල් වීරසිංහ**

## 2 වන වාරය | 2025 අප්‍රේල් 28 - අගෝස්තු 2

# සවස් කාලයේ පැවැත්වෙන පාඨමාලා

## අන්තර්ජාලය හරහා

### නික්මයාමේ සිට ද්විතීය කථාව දක්වා

පුරාණ ඉශ්‍රායෙලයේ හැඩගැස්ම, මහත් පරිශ්‍රමය සහ ව්‍යවස්ථාව පිළිබඳ කරුණු ආවරණය වන පංච පුස්තකයේ විශාල කොටසක් අධ්‍යයනය කිරීමට මෙම පාඨමාලාවෙන් ඔබට අවස්ථාව ලබා දෙයි. එක් එක් පොතේ ආකෘතිය, එහි පණිවිඩය, ඉශ්‍රායෙල් සෙනඟට එය අදාළ වූයේ කෙසේද සහ එය අදට අදාළ කරගන්නේ කෙසේද යන්න ආවරණය කෙරේ.

BTh | Dip වෛකල්පික

සති 10

දිනය: අඟහරුවාදා

වේලාව: ප.ව. 6:00-8:30

ආරම්භය: අප්‍රේල් 29

සම්මාන: 2

කථිකාචාර්ය: **මහින්ද මුණසිංහ**

### ආමොස් පොත

අපගේ සමාජයේ පෙර නොවූ විරූ ලෙස දූෂණය, අසාධාරණය සහ ප්‍රචණ්ඩත්වය දක්නට ලැබේ. දෙවියන් වහන්සේට හිමි ගෞරවය ලැබෙන ලෙස සමාජය පරිවර්තනය පිණිස අප කෙසේ ප්‍රතිචාර දැක්විය යුතුද? ආමොස් පොත විස්මය ජනක ලෙස කාලීන වැදගත්කමක් ඇති හෙයින් කිතුනුවන්ට ප්‍රයෝජනවත් බයිබලීය පොතකි.

BTh | Dip වෛකල්පික

සති 12

දිනය: සිකුරාදා

වේලාව: ප.ව. 6:00-8:00

ආරම්භය: මැයි 2

සම්මාන: 2

කථිකාචාර්ය: **දිලිප් ගුණවීර**

# 3 වාරය

# 2025 සැප්තැම්බර් 1 - නොවැම්බර් 29

○ පන්ති කාමරය තුළ | □ අන්තර්ජාලය හරහා | ★ මිශ්‍ර ශික්ෂණ මාධ්‍ය

# කාල සටහන - 3 වන වාරය

| වේලාව | සඳුදා | අඟහරුවාදා | බදාදා | බ්‍රහස්පතින්දා | සිකුරාදා |
|---|---|---|---|---|---|
| උදෑසන | ○ සාකල්‍ය ළමා සංවර්ධනය<br>පෙ.ව.9:00-පෙ.ව.11:30<br>චමිලා සුභාෂ් රණසිංහ | ○ ශුද්ධ ආත්මයාණන්ගේ පුද්ගලත්වය සහ කාර්යය<br>පෙ.ව.9:00-පෙ.ව.11:00<br>රවින් කල්දේරා | ○ පැරණි ගිවිසුමට හැඳින්වීමක්<br>පෙ.ව.9:00-ප.ව.12:30<br>චමිලා සුභාෂ් රණසිංහ<br>□ අධ්‍යයන ක්‍රමවේද<br>පෙ.ව.9:00-ප.ව.12:30<br>රවින් කල්දේරා<br>සහභාගිකමේ කාලය<br>පෙ.ව.10:30-පෙ.ව.11:30 | ○ කිතුනු සේවකයෙකුගේ ජීවිතය සහ කාර්යය<br>පෙ.ව.9:00-ප.ව.12:30<br>සනත් අතුකෝරාළ<br>දේව මෙහෙය<br>පෙ.ව.10:30-පෙ.ව.11:30 | □ නෙහෙමියා පොත<br>පෙ.ව.9:00-පෙ.ව.11:15<br>මහින්ද මුණසිංහ |
| දහවල් | ○ කුඩා කණ්ඩායම් සේවය<br>ප.ව.3:00-ප.ව.5:15<br>බෙනිසි සිල්වා | ○ සභාව තුළ අධ්‍යාපන සේවයක් ඇති කිරීම<br>ප.ව.3:00-ප.ව.5:00<br>සනත් අතුකෝරාළ | | ○ ජොහන් ශුභාරංචිය<br>ප.ව.3:00-ප.ව.5:00<br>ර්න්ස්ටීන් ප්‍රනාන්දු | ○ 1 සහ 2 සාමුවෙල්<br>ප.ව.3:00-ප.ව.5:15<br>නාමල් වීරසිංහ |
| සවස | □ සභා පරිපාලනය<br>ප.ව.6:00-ප.ව.8:15<br>සුරංග අතුකෝරාළ | ○ දේවධර්මයට හැඳින්වීම<br>ප.ව.6:00-ප.ව.8:00<br>ෂර්ලි ෆේබර් | ○ ඉගෙනීමට යෝග්‍ය පරිසරයක් නිර්මාණය කිරීම<br>ප.ව.6:00-ප.ව.8:15<br>සරත් ද සිල්වා<br>□ මවකගේ අභිප්‍රාය<br>ප.ව.6:00-ප.ව.8:15<br>ක්‍රිස්ති එදිරිසිංහ | □ බලපෑමක් ඇති කළ දූතනගාමියෝ<br>ප.ව.6:00-ප.ව.8:00<br>සනත් අතුකෝරාළ | □ අර්ථකථනවේදය<br>ප.ව.6:00-ප.ව.8:15<br>දිලිප් ගුණවීර |

*නොවැළැක්විය හැකි හේතු මත ප්‍රකාශිත කාල සටහන වෙනස් විය හැකිය. ලියාපදිංචි වීමට පෙර අධ්‍යයන කාර්යාලයෙන් විමසන්න.*

## 3 වන වාරය | 2025 සැප්තැම්බර් 1 - නොවැම්බර් 29

# උදෑසන සහ දහවල් කාලයේ පැවැත්වෙන පාඨමාලා

## පන්ති කාමරය තුළ

| | |
|---|---|
| **සාකල්‍ය ළමා සංවර්ධනය**<br>දේශයක මෙන්ම සභාවේ ද අනාගත බලාපොරොත්තුව ළමයින් ය. මෑත යුගයේ සාකල්‍ය ළමා සංවර්ධනයට පදනම වී ඇත්තේ බයිබලීය මූලධර්මයන් ය. ළමුන්ගේ වර්ධනීය මූලධර්මයන් වන ශාරීරික, මානසික, චිත්තාවේගීය, සමාජීය සහ ආධ්‍යාත්මික යන අංශ පහ ඔස්සේ අධ්‍යයනයේ යෙදේ. කිතුනු කැඳවීම තුළ ළමුන් හැඩගස්වා වර්ධනය කරන්නේ කෙසේදැයි ඉගෙනීමට මං පාදයි. | **BTh\|Dip වෛකල්පික**<br>සති 10<br>දිනය: සඳුදා<br>වේලාව: පෙ.ව. 9:00-11:30<br>ආරම්භය: සැප්තැම්බර් 8<br>සම්මාන: 2<br>කථිකාචාර්ය: **චමිලා සුභාෂ් රණසිංහ** |
| **කුඩා කණ්ඩායම් සේවය**<br>සභාවක සාර්ථකත්වය රඳා පවතින්නේ එහි ඇති කුඩා කණ්ඩායම්වල බලපෑම මතය. බයිබල් අධ්‍යයන කණ්ඩායමක් සැකසීම, විෂය මාලාව සැකසීම, කුඩා කණ්ඩායමට නායකත්වය දීම තුළින් සභාවේ සාමාජිකයන්ගේ වර්ධනයට පංගුකාරත්වයක් දැරීමට මෙය අනගි අවස්ථාවකි. | **BTh\|Dip වෛකල්පික**<br>සති 11<br>දිනය: සඳුදා<br>වේලාව: ප.ව. 3:00-5:15<br>ආරම්භය: සැප්තැම්බර් 1<br>සම්මාන: 2<br>කථිකාචාර්ය: **බෙනිසි සිල්වා** |
| **ශුද්ධ ආත්මයාණන්ගේ පුද්ගලත්වය සහ කාර්යය**<br>පසුගිය සියවස තුළ අන් කවරදාටත් වඩා ශුද්ධ ආත්මයාණන් පිළිබඳ කථාබහ සහ සාකච්ඡා පිළිබඳ මහත් උනන්දුවක් ඇතිවී ඇත. ඉතිහාසය පුරා ශුද්ධ ආත්මයාණන් පිළිබඳ දේවවේදය ගොඩනැගුණු ආකාරය ද ශුද්ධ ආත්මයාණන් පිළිබඳව බයිබලය පවසන දේ ද ඉගෙන ගැනීමට අවස්ථාවකි. සභාව තුළත් ඇදහිලිවන්තයන්ගේ ජීවිතය තුළත් ශුද්ධ ආත්මයාණන්ගේ සුවිශේෂී වූත් බලවත් වූත් ක්‍රියා පිළිබඳ දැනගැනීමට මහගු අවස්ථාවකි. | **BTh\|Dip අනිවාර්ය**<br>සති 12<br>දිනය: අඟහරුවාදා<br>වේලාව: පෙ.ව. 9:00-11:00<br>ආරම්භය: සැප්තැම්බර් 2<br>සම්මාන: 2<br>කථිකාචාර්ය: **රවින් කල්දේරා** |
| **සභාව තුළ අධ්‍යාපන සේවයක් ඇති කිරීම**<br>ඔබ ඉරුදින පාසලේ, තරුණ කණ්ඩායම්වල, බයිබල් අධ්‍යයන කණ්ඩායම් වැනි දේවල ඉගැන්වීමේ නිරතව සිටින්නේ නම් ඔබ කිතුනු අධ්‍යාපනයේ කොටස්කරුවෙකි. ඉගැන්වීම පිළිබඳව බයිබලය පවසන්නේ කුමක්දැයි මෙම පාඨමාලාවේදී ඔබට දැනගත හැකිය. ජීවිත වෙනස් කරන ලෙස ඔබ අපේක්ෂිත කණ්ඩායම පලදායි ලෙස ඉගැන්වීමට ගැළපෙන පුහුණුවක් සකස්කර ගැනීමට මෙහිදී ඔබට උගන්වනු ලැබේ. | **BTh\|Dip වෛකල්පික**<br>සති 12<br>දිනය: අඟහරුවාදා<br>වේලාව: ප.ව. 3:00-5:00<br>ආරම්භය: සැප්තැම්බර් 2<br>සම්මාන: 2<br>කථිකාචාර්ය: **සනත් අතුකෝරාළ** |

## 3 වන වාරය | 2025 සැප්තැම්බර් 1 - නොවැම්බර් 29
# උදෑසන සහ දහවල් කාලයේ පැවැත්වෙන පාඨමාලා
## පන්ති කාමරය තුළ

### පැරණි ගිවිසුමට හැඳින්වීමක්
**BTh|Dip අනිවාර්ය**

පැරණි ගිවිසුමේ සෑම පොතක් පිළිබඳව එහි කතුවරයා අන්තර්ගතය, සැකිල්ල, ප්‍රධාන තේමා සහ ඓතිහාසික පසුබිම ආදී කරුණු පිළිබඳ සංක්ෂිප්ත දැක්මක් ලබාදෙයි. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ විසින් කියවන ලද බයිබලයේ ඇති විවිධ පොත් ඇගයීමට හා ඒවා රස විඳීමට හැකියාවක් ලැබෙන අතර පැරණි ගිවිසුම තේරුම් ගැනීමට මෙම පාඨමාලාව ඉමහත් රුකුලක් වනු ඇත.

සති 11
දිනය: බදාදා
වේලාව: පෙ.ව. 9:00-ප.ව. 12:30
ආරම්භය: සැප්තැම්බර් 3
සම්මාන: 2
කථිකාචාර්ය: **චමිලා සුභාෂ් රණසිංහ**

### කිතුනු සේවකයෙකුගේ ජීවිතය සහ කාර්යය
**BTh|Dip වෛකල්පික**

කිතුනු සේවකයෙකු වීමේ අද්විතීය කැඳවීම තේරුම් ගැනීමට උපකාරී වන විෂයකි. ප්‍රාදේශීය සභාවේ ද සමාජයේ ද උද්යෝගීමත්, බලවත් සේවකයෙකු විය හැක්කේ කෙසේද? නායකයෙකු ලෙස වර්ධනය වන අතරම, ආත්මික ජීවිතය ද ශක්තිමත් පවුල් සබඳතාවයක් ද තබා ගන්නා ආකාරය ඉගෙනීමට අවස්ථාව ලැබේ.

සති 12
දිනය: බ්‍රහස්පතින්දා
වේලාව: පෙ.ව. 9:00-ප.ව. 12:30
ආරම්භය: සැප්තැම්බර් 4
සම්මාන: 2
කථිකාචාර්ය: **සනත් අතුකෝරාළ**

### ජොහන් ශුභාරංචිය
**BTh|Dip වෛකල්පික**

ලියොන් මොරිස් මෙසේ පවසයි: "ජොහන් ශුභාරංචිය යනු කුඩා ළමයකුට දිය මත ඇවිදිය හැකි වූත් හස්තියකුට දිය නෑ හැකිවූත් තටාකයකි." මෙම මාහැඟි ශුභාරංචි පොත තුළ ජොහන් තුමා යේසුස් වහන්සේගේ ඓතිහාසිකත්වය ද උන් වහන්සේගේ පෘථුල ඉගැන්වීම ද ගෙන හැර දක්වයි. ඉතා වැදගත් ක්‍රිස්තියානි ධර්මනියාම ගවේෂණය කරමින් ශ්‍රාවකත්වය සඳහා විප්ලවීය කැඳවීමක් ජොහන් තුමා කරයි.

සති 12
දිනය: බ්‍රහස්පතින්දා
වේලාව: ප.ව. 3:00-5:00
ආරම්භය: සැප්තැම්බර් 4
සම්මාන: 2
කථිකාචාර්ය: **ඊන්ස්ටීන් ප්‍රනාන්දු**

### 1 සහ 2 සාමුවෙල්
**BTh|Dip වෛකල්පික**

විනිශ්චයකරුවන්ගේ සමයේ සිට රජවරුන්ගේ සමය දක්වා ඉශ්‍රායෙල් ඉතිහාසයේ සිදුවීම් සාමුවෙල් පොත්වල දැක්වේ. ඒලි, සාමුවෙල්, සාවුල් සහ දාවිත් යන අය හඳුන්වා දෙමින් ඔවුන්ගේ ජීවිතවලින් අපට පාඩම් උගන්වනු ලබයි. අලුතින් ස්ථාපනය කරනු ලැබූ රාජත්වය නැමැති සමාජ ආයතනය තුළ දෙවියන් වහන්සේ තම සෙනඟ සමඟ කටයුතු කරන ආකාරය හා උන්වහන්සේගේ චරිත ස්වභාවය පිළිබඳ අධ්‍යනයෙන් අපගේ දැනුම ගැඹුරු කරන්නේය.

සති 11
දිනය: සිකුරාදා
වේලාව: ප.ව. 3:00-5:15
ආරම්භය: සැප්තැම්බර් 12
සම්මාන: 2
කථිකාචාර්ය: **නාමල් වීරසිංහ**

3 වන වාරය | 2025 සැප්තැම්බර් 1 - නොවැම්බර් 29

# උදෑසන සහ සවස් කාලයේ පැවැත්වෙන පාඨමාලා

## අන්තර්ජාලය හරහා

### අධ්‍යයන ක්‍රමවේද

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ මෙහෙවරෙහි දක්වන කරුණක් වන්නේ "උසස්ම ශාස්ත්‍රීය ප්‍රමිතියට අනුව..." අපගේ පුහුණුව කරන බවය. එහෙයින් මෙම පාඨමාලාව කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ විෂය නිර්දේශයන්හි අවශ්‍යතාවන් පැහැදිලි කර දෙන අතර සිසුවෙකු ලෙස විශිෂ්ටත්වයට පත්වීමට ඇවැසි සටහන් තබාගැනීමේ හැකියාව, වේගයෙන් කියවීම, පර්යේෂණ කිරීම, රචනා ලිවීම ආදී කුසලතාවන්ගෙන් ඔබ පූර්ණ කරනු ලබයි.

**BTh|Dip අනිවාර්ය**

සති 11

දිනය: බදාදා

වේලාව: පෙ.ව. 9:00-ප.ව. 12:30

ආරම්භය: සැප්තැම්බර් 3

සම්මාන: 0 (2)

කථිකාචාර්ය: **රවින් කල්දේරා**

### නෙහෙමියා පොත

අද්විතීය නායකයෙකු පිළිබඳ සංක්ෂිප්ත, පුළුල් චරිත කථාවක් පරණ ගිවිසුමේ වෙන කිසිම පොතක දක්නට නැත. අතිශයින් මන බඳනා මෙම කථාන්දරය කියවීමෙන් ඔබට බයිබලීය නියමයන් පිළිබඳ වටිනා දැනුමක්ද ඒ තුළින් දර්ශනයක් ගොඩනැංවීම, අන් අය සංවිධානය කිරීම, ප්‍රශ්න හමුවේ නොසැලී සිටීම සහ අරමුණු ඉටු කරගැනීමට ඔබට මග පාදා දෙයි.

**BTh|Dip වෛකල්පික**

සති 11

දිනය: සිකුරාදා

වේලාව: පෙ.ව. 9:00-11:15

ආරම්භය: සැප්තැම්බර් 12

සම්මාන: 2

කථිකාචාර්ය: **මහින්ද මුණසිංහ**

### සභා පරිපාලනය

මුල්‍යමය හා පරිපාලනමය වගකීම් සමර්ථ ලෙස කිරීමට සෑම සභාවකම යම් යම් පුද්ගලයන්ගෙන් බලාපොරොත්තු වේ. මෙම වගකීම් නොසලකා හැරීම හෝ අනිසි ලෙස සිදුකිරීම හේතුවෙන් බොහෝ සභා අර්බුදයන්ට පත්වේ. මුල්‍යමය වගවීම හා අයවැය සැලසුම, සංවිධානයේ ක්‍රියාවලියන් සුමටව සිදුකිරීමට අවශ්‍ය ව්‍යුහයන් හා ක්‍රියාමාර්ග සැකසීම වැනි ප්‍රායෝගික හැකියා මෙම පාඨමාලාවෙන් හඳුන්වා දෙනු ලැබේ.

**BTh|Dip වෛකල්පික**

සති 11

දිනය: සඳුදා

වේලාව: ප.ව. 6:00-8:15

ආරම්භය: සැප්තැම්බර් 1

සම්මාන: 2

කථිකාචාර්ය: **සුරංග අතුකෝරාළ**

### මවකගේ අභිප්‍රාය

දේව සේවයේ යෙදෙන්නන් මෙන්ම පරිණත ඇදහිලිවතුන් සභාවෙහි හෝ සමාජයෙහි කටයුතු කිරීමේදී මවක හා පියෙකු සේ කටයුතු කළ යුතු ය. දෙවිඳුන් විසින් සෑම කිතුනුවෙකු ම කැඳවන භූමිකාවන්හි ජීවත් වීමෙන් ලෝකය ශ්‍රාවකත්වයට ගෙනෙන අයුරු මෙහිදී සාකච්ඡාවට බඳුන් කෙරේ. දේව අභිප්‍රාය අවබෝධ කොට ඒසේ ජීවත් වීමට "Mother Design" නම් ලෝ ප්‍රචලිත ප්‍රායෝගික ඉගැන්වීම් මාලාවක් අධ්‍යයනයට මෙම පාඨමාලාවෙන් අවස්ථාව ලැබේ.

**BTh|Dip වෛකල්පික**

සති 11

දිනය: බදාදා

වේලාව: ප.ව. 6:00-8:15

ආරම්භය: සැප්තැම්බර් 3

සම්මාන: 2

කථිකාචාර්ය: **ක්‍රිස්නි එදිරිසිංහ**

## 3 වන වාරය | 2025 සැප්තැම්බර් 1 - නොවැම්බර් 29
# සවස් කාලයේ පැවැත්වෙන පාඨමාලා
## අන්තර්ජාලය හරහා

### බලපෑමක් ඇති කළ දූතනගාමියෝ

දෙවියන් වහන්සේගෙන් මහත් දේ බලාපොරොත්තු වූ හා උන්වහන්සේ වෙනුවෙන් මහත් දේ සඳහා වෙහෙස වූ මිනිසුන්ගේ ජීවිත හා මෙහෙය දෙස බැලීමක් මෙයින් සිදුවේ. දෙවියන් වහන්සේ මේ විශ්වාසවන්ත සේවකයන් තුළින් ඔබ ප්‍රබෝධවත් කර නිර්භීතව හා විශ්වාසවන්තව ක්‍රිස්තුස් වහන්සේ අනුගමනය කිරීමට ඔබට උගන්වන සේක්වා.

සති 12 **BTh|Dip වෛකල්පික**

දිනය: බ්‍රහස්පතින්ද

වේලාව: ප.ව. 6:00-8:00

ආරම්භය: සැප්තැම්බර් 4

සම්මාන: 2

කථිකාචාර්ය: **සනත් අතුකෝරාළ**

### අර්ථකථනවේදය

***අර්ථකථනය කිරීමේ ශිල්පය සහ එහි ඉතිහාසය***

අර්ථකථනවේදයේදී දේවධර්මයේ වර්ධනය උදෙසා බයිබලය අර්ථකථනය කර ඇත්තේ කෙසේදැයි යන්න විමසා බැලේ. බයිබලය අර්ථකථනය කිරීමේදී යොදගන්නා විවිධ මාර්ගයන් මෙහිදී ඔබට හඳුන්වා දෙනු ඇත. ඔබ මෙතෙක් උපකල්පනය කළ දේ ගැන විමසා බැලීමටත් ශුද්ධ ලියවිලි කියවීමේදී හා අර්ථකථනය කිරීමේදී වඩා හොඳ ක්‍රමවේද භාවිත කිරීමටත් ඔබට හැකිවනු ඇත.

සති 11 **BTh|Dip වෛකල්පික**

දිනය: සිකුරාද

වේලාව: ප.ව. 6:00-8:15

ආරම්භය: සැප්තැම්බර් 12

සම්මාන: 2

කථිකාචාර්ය: **දිලිප් ගුණවීර**

# සවස් කාලයේ පැවැත්වෙන පාඨමාලා

## පන්ති කාමරය තුළ

### දේවධර්මයට හැඳින්වීම

**BTh|Dip අනිවාර්ය**

අප අදහන දෙය ගැන පැහැදිලි දැනුමක් අපට තිබේද? අපගේ ඇදහිල්ල වෙනත් අයකුට පහදා දීමට ගොස් පැටලී නිරුත්තර වී තිබේද? දේවධර්මයට හැඳින්වීම විෂය ඉගෙනීමෙන් ඔබේ ඇදහිල්ල ඔබටම වඩා පැහැදිලි වන අතර අන් අයටත් ආත්ම විශ්වාසයෙන් යුක්තව පහදා දීමට හැකි මඟ පෑදීමක් කරයි.

සති 12

දිනය: අඟහරුවාදා

වේලාව: ප.ව. 6:00-8:00

ආරම්භය: සැප්තැම්බර් 2

සම්මාන: 2

කථිකාචාර්ය: **ෂර්ලි ෆේබර්**

### ඉගෙනීමට යෝග්‍ය පරිසරයක් නිර්මාණය කිරීම

**BTh|Dip වෛකල්පික**

ඉරුදින පාසැලේ, කුඩා කණ්ඩායමේ හා පංති කාමරයේ කිතුනු ගුරුවරයාගේ අපේක්ෂාව වන්නේ ශිෂ්‍යයන්ගේ ජීවිතවල පැහැදිලි වෙනසක් ඇති කිරීමය. ඔබගේ ඉගැන්වීමේ සේවය වඩා සාර්ථක කරගැනීමට අත්‍යවශ්‍ය ශිෂ්‍ය-කේන්ද්‍රීය විධික්‍රම රාශියක් මෙම පාඨමාලාවෙන් ලබාගත හැකිවේ. විවිධ වූ ඉගෙනීමේ රටා තේරුම් ගැනීම, ඉගෙනීමේ ප්‍රගතිය නිර්මාණය කිරීමේ මානයන්, පාඩම් සැලසුම් කිරීමේ ක්‍රමෝපායන් මේ පාඨමාලාවේදී සාකච්ඡා කෙරේ.

සති 11

දිනය: බදාදා

වේලාව: ප.ව. 6:00-8:15

ආරම්භය: සැප්තැම්බර් 3

සම්මාන: 2

කථිකාචාර්ය: **සරත් ද සිල්වා**


# කථිකාචාර්යවරුන්ගේ විස්තර



**සුරංග අතුකෝරාළ,** ADCN, DIM, BTh
කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියෙකු වන අතර, හිටපු තොරතුරු තාක්ෂණ කළමනාකරු හා සහකාර පුස්තකාලයාධිපතිවරයාය. ජනතා දේවසභාවේ ප්‍රාදේශීය නායකයෙකු ලෙස සේවය කරන අතර පාලන මණ්ඩලයේ පරිපාලන කමිටුවේ සභාපති ධුරයද දරයි. එලෙසම දේව සභා සංගමයේ (එසෙම්බ්ලි ඔෆ් ගෝඩ්) අක්තපත්‍රධාරියෙක් වන හෙතෙම වර්තමානයේ ජීවිතාලෝකය හි උපදේශක/පරිපාලක සහ මානව සම්පත් කළමනාකරු වශයෙන්ද කටයුතු කරන්නේය. කිතු බැති ගී දැහැන සිංහල ගීතිකා කෝඩ් ඇප් හා වෙබ් සේවය මොහුගේ නිර්මාණයි.



**මහින්ද මුණසිංහ,** BTh, MA
කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියකු වන අතර කැම්පස් ක්‍රෘසේඩ් ෆොර් ක්‍රයිස්ට් සහ නැවිගේටර්ස් ආයතනයන් හි දිගු කලක් සේවය කර ඇත. පිලිපීනයේ ජාත්‍යන්තර නායකත්ව පිළිබඳ විද්‍යාලයේ (IGSL) පරිවර්තනාත්මක නායකත්වය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ඇත. මෙතෝදිස්ත සභාවේ ගිහි නායකයෙක් සහ පූර්ණ ගිහි දේශකයෙක් ලෙස සේවය කරන අතර වර්තමානයේ ගෝලයන් ගොඩනැගීමේ සේවාවේ නියුක්තව සිටි.



**සනත් අතුකෝරාළ,** BSc, BTh, MA (Hons), PhD
**කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ අධ්‍යාත්මික ගොඩනැගීම් සම්බන්ධීකාරකවරයාය.** කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරයෙකු වන මෙතුමා ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ජෛව විද්‍යාව පිළිබඳ උපාධියද, ටෝච් ට්‍රිනිටි විශ්වවිද්‍යාලයේ ක්‍රිස්තියානි අධ්‍යාපනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (2007) සහ අධ්‍යාපන අධ්‍යයනය පිළිබඳ ආචාර්ය උපාධිය (2020) ද ලබා ඇත. වසර 20 කටත් වැඩි දේව සේවයේ හා ඉගැන්වීමේ සේවයේ පළපුරුද්දක් ඇති අතර මෙතුමා සියලු ජාතීන්ගේ සභාවේ සාමාජිකයෙකි.



**ඊන්ස්ටීන් ප්‍රනාන්දු,** HND (Counselling), BTh, PgDip (BAPC)
කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියෙකු හා ගුරු මණ්ඩල සාමාජිකයෙකි. කිතුසෙවණ සේවයේ දේවගැතිවරයෙකු ලෙස ද ගෝලත්ව මධ්‍යස්ථානයේ ගුරුවරයෙක් හා උප විදුහල්පතිවරයෙක් ලෙස ද කටයුතු කර තිබේ. උපදේශන කටයුතුවල නිරත වන අතර ශ්‍රී ලංකා පදනම් ආයතනයෙන් උසස් ජාතික උපදේශන ඩිප්ලෝමාව ලබාගත්තේය.

# කථිකාචාර්යවරුන්ගේ විස්තර




**රවින් කල්දේරා,** DipAgri, BTh, BA , MA

**කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ පීඨාධිපතිය.** කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ හා විවෘත විශ්ව විද්‍යාලයේ උපාධිධාරියෙකි. ඩලස් දේවධර්ම ශාස්ත්‍රාලයෙන් බයිබල් අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ඇති හෙතෙම අවුරුදු ගණනාවක පුරෝගාමී සභාරෝපණ සේවයේ අත්දැකීම් ඇත්තෙකි. පුරාතන මැදපෙරදිග හා බයිබලයේ භූගෝලය පිළිබඳ අවබෝධය නිසා ලංකාවේ ප්‍රකාශනයන්හි සිතියම් නිර්මාණය සඳහා සම්පත් දයකයකු ලෙස කටයුතු කොට ඇත. ජීවමාන ක්‍රිස්තු සභාවේ දේවගැතිවරයෙකි.



**සරත් ද සිල්වා,** BTh, MDiv

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ දේවවේදි උපාධියද, නායකත්වය පිළිබඳ ජාත්‍යන්තර උපාධි විද්‍යාලයේ (IGSL–Philippines) ශාස්ත්‍රපති උපාධියද ලබා ඇත. වසර 30කට අධික කාලයක් පුරා විවිධ සේවා ක්ෂේත්‍රවල පුළුල් අත්දැකීම් ඇති, වර්තමානයේ ඌව, නැගෙනහිර හා බස්නාහිර යන පළාත්හි බොහෝ පුරෝගාමී සේවකයින්ගේ මිත්‍රෝපදේශයෙකු (Mentor) ලෙස කටයුතු කරයි. තවද පීඩා විඳින සභාවන් වෙනුවෙන් සේවය කරන නිව් හාර්වෙස්ට් ෆවුන්ඩේෂන් ආයතනයේ ජාතික අධ්‍යක්ෂක වශයෙන් ද කටයුතු කරයි. ජීවමාන ක්‍රිස්තු සභාවේ දේවගැතිවරයෙකි.



**ජී පී වී සෝමරත්න,** BA, MA (Missiology), MA (Theology), PgDip (Demography), PhD

**කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ සම්මාන මහාචාර්යතුමාය.** විපුල ඵලැති ගවේෂකයෙකු හා අධ්‍යාපනික පොත් සහ ලිපිවල කර්තෘවරයෙකි. මෙතුමා කොළඹ විශ්වවිද්‍යාලයේ නූතන ඉතිහාසය පිළිබඳ මහාචාර්ය ධුරය හෙබවූ අතර යෙරුසලමේ හෙබ්‍රෙව් විශ්වවිද්‍යාලයේ ට්‍රූමන් ආයතනයේ ද, ලීඩ් විශ්වවිද්‍යාලයේ සහ ෆුලර් දේවධර්ම ශාස්ත්‍රාලයේ බාහිර කථිකාචාර්යවරයෙකු ලෙස ද සේවය කර ඇත. කාණ්ඩ හතකින් සමන්විත ශුද්ධ බයිබලයේ විශ්වකෝෂයේ කර්තෘවරයාය.



**මධු මිහිරි ප්‍රනාන්දු,** Dip MME, BA, MA

කැලණිය විශ්වවිද්‍යාලයේ උපාධිධාරිණියකි. වසර විසි දෙකක් කොළඹ බිෂොප් විදුහලේ ගුරුවරියක් ලෙස සේවය කළ අතර උපදේශකවරියක් ලෙසද කටයුතු කරයි. ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය නාලිකා හි වැඩසටහන් මෙහෙය වන්නියක් වන අතර කිතුනු ගුරු පුහුණු උපදේශකවරියක් ලෙසද සේවය කරයි. ශ්‍රී ලංකා මෙතෝදිස්ත සභාවේ සම්පූර්ණ ගිහි දේශිකාවකි.

# කථිකාචාර්යවරුන්ගේ විස්තර



**මිශෙල් පීරිස්,** BTh, MA
ලංකා දේව සභාවේ (එසෙම්බ්ලීස් ඔෆ් ගෝඩ් ඔෆ් සිලෝන්) බලපත්‍රලාභී දේවගැතිවරියක වන ඇය ජාතික මට්ටමින් තරුණ සේවය සඳහා විෂයමාලා සකස් කිරීමට සම්බන්ධ වී ඇත. ආසියා පැසිෆික් දේවධර්ම ශාස්ත්‍රාලයේ (APTS) සහ දකුණු ආසියා බයිබල් විද්‍යාලයේ (SABC) උපාධිධාරිනියකි. ඇය ශ්‍රී ලංකාවේ බයිබල් විද්‍යාලවල ප්‍රායෝගික දේවධර්මය සහ ඉතිහාසය පිළිබඳ පාඨමාලා ඉගැන්වීමේ බාහිර කථිකාචාර්යවරියක් ලෙස සේවය කර ඇත.



**බෙනිසි සිල්වා,** BTh, MDiv
කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ දේවවේදි උපාධියද, පිලිපීනයේ නායකත්වය පිළිබඳ ජාත්‍යන්තර උපාධි විද්‍යාලයේ (IGSL) දේවධර්මය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියද ලබා ඇත. දැනට කිතුනු ධර්මය ඉගැන්වීමේ හා පුහුණුකිරීමේ සේවයේ යෙදී සිටින අතර, අවුරුදු 10ක පමණ තරුණ සේවයේ නායකත්වයද අවුරුදු 24ක පමණ සභාවේ දේවගැති සේවයේද අත්දැකීම් ලද්දෙකි.



**චමිලා සුභාෂ් රණසිංහ,** HND (Counselling), BTh
කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරිණියකි. වසර 8ක කාලයක් සභාපාලිකාවක් ලෙස සේවයේ නිරතව සිටි අතර, පසුව ජීවිතාලෝක ආයතනයේ සිංහල සේවා කළමණාකාරිනිය වශයෙන්ද කටයුතු කරන ලදි. රූපවාහිනි සහ ගුවන්විදුලි කිතුනු වැඩසටහන් නිෂ්පාදිකාවක් සහ නිවේදිකාවක් වන අතර කිතුනු ලිපි හා පොත්පත් ලේඛිකාවක්ද වෙයි. ශ්‍රී ලංකා පදනම් ආයතනයේ උපදේශනය පිළිබද ජාතික ඩිප්ලෝමාව ද (NDC) උසස් ජාතික ඩිප්ලෝමාව ද (HND) ලබා ඇත. මෙතෝදිස්ත සභාවේ ගිහි දේශිකාවකි.



**මනෝජ් පීරිස්,** DipHTM, BTh
කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියෙකි. මීගමුව ප්‍රදේශයේ පැල්පත්වාසී ජනතාව සමඟ සේවය කරන අතර Friends In Christ ගෝලත්ව සේවයෙහි පුරෝගාමී හා මිත්‍රෝපදේශක ලෙස කටයුතු කරයි. ජීවමාන ක්‍රිස්තු සභාවේ තරුණ සේවය භාර පාලකවරයා ලෙස ද ලංකා ප්‍රෙස්බිටේරියානු තරුණ ලීගයේ සම-සාමාජික (Co-Opt Member) ලෙස ද වගකීම් දරයි. සිංගප්පූරුව කවනන්ට් ප්‍රෙස්බිටේරියානු සභාවේ ශ්‍රී ලාංකීය සේවයෙහි ලාංකීය කලාපය භාර සභාපාලකවරයෙක් ලෙස ද කටයුතු කරයි.



**නිශාන්ත ගුණසේකර,** BTh, MTS
ශ්‍රී ලංකාවේ මෙතෝදිස්ත සභාවේ හස්තාලේපලත් දේවගැතිවරයා වන අතර දැනට පැපිලියාන සහ කරගම්පිටිය මෙතෝදිස්ත දේවස්ථාන භාරව සේවය කරයි. ඉන්දියාවේ සෙරම්පෝර් විශ්ව විද්‍යාලයේ (BTh) උපාධිය ද ඇමරිකා එක්සත් ජනපදයේ චිකාගෝ හි මැකෝමික් දේවධර්ම සම්මන්ත්‍රණය (MTS) උපධියද ලබා ඇත.


# කථිකාචාර්යවරුන්ගේ විස්තර



**ක්‍රිස්නි එදිරිසිංහ,** BTh, MA (candidate)
**කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ සම්බන්ධීකාරක: ළමා සේවා ක්ෂේත්‍රය.** කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරිණියකි. විසිවසරකට ආසන්නව ඉරුදින පාසල් හා පෙරපාසල් ගුරුවරියක් වශයෙන්ද අනතුරුව "ශ්‍රී ලංකා ළමා ධර්මදූත සහභාගිත්වයේ" (CEF) මොරටු ශාඛාවේ අධ්‍යක්ෂිකාව ලෙසද සේවයකර ඇත. ඇය පිලිපීනයේ ආසියා-ශාන්තිකර නසරීන දේවධර්ම ශාස්ත්‍රාලයේ (APNTS) සාකල්‍ය ළමා සංවර්ධනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියේ අවසාන පර්යේෂණ නිබන්ධනයේ කටයුතුවල නියැලෙන්නීය.



**ෂර්ලි ෆේබර්,** BTh
ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි රෙපරමාදු සභාවේ හසල අත්දැකීමක් ඇති දේවගැතිවරයකු මෙන් ම, වර්තමානයේ මහා නායකතුමන් ද වෙයි. ලංකා බයිබල් විද්‍යාලයේ උපාධිධාරියෙකි. කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ පාලක මණ්ඩලයේ (හිටපු) සාමාජිකයෙකි.



**දුලිප් ප්‍රනාන්දු,** BSc (Eng), BD, ThM
විශ්‍රාමික මෙතෝදිස්ත දේවගැතිවරයෙකි. මෙතුමා පේරාදෙනිය විශ්ව විද්‍යාලයේද ලන්ඩන් දේවධර්ම විද්‍යාලයේද (එක්සත් රාජධානිය) ෆුලර් දේවධර්ම ශාස්ත්‍රාලයේද (ඇමරිකාව) උපාධිධාරියෙකි. ඉංජිනේරු පසුබිමක් සහිත මෙතුමා කටුබැද්ද උසස් තාක්ෂණික විද්‍යාලයේද පසුව මොරටුව විශ්ව විද්‍යාලයේද දේශකයකු ලෙස කටයුතු කර ඇත. එතුමා ශ්‍රී ලංකා මෙතෝදිස්ත සභාවේ සභාපතිවරයෙකු ලෙසද කටයුතු කර ඇත.



**නාමල් වීරසිංහ,** BTh
කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියෙකි. යෞවන කිතුමඟ සංවිධානයේ හි (YFC) වසර 24ක පූර්ණකාලීන සේවයේ නියැලී සිටින එතුමන් වර්තමානයේ තාරුණ්‍යය දිරිගැන්වීමේ සේවය භාරව කටයුතු කරනු ලබයි. උපදේශන කටයුතුවල නිරත වන අතර ඒ පිළිබඳ වැඩිදුර හදාරයි. එතුමන් ශ්‍රී ලංකා මෙතෝදිස්ත සභාවේ ගිහි දේශකයකු ලෙසද කටයුතු කරයි.



**දිලිප් ගුණවීර,** BTh
කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියෙකු හා ගුරු මණ්ඩල සාමාජිකයෙකි. එසේම කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ රජරට දුරස්ථ අධ්‍යාපන පීඨයේ සම්බන්ධීකාරක ලෙස ද කටයුතු කරයි. වසර 13 ක කාලයක් කල්වාරි දේවස්ථානයේ සභාපාලක සේවයේ අත්දැකීම් ඇත. වර්තමානයේ අනුරාධපුර ලංකා දේව සභාවේ ගිහි දේශකයෙකු සහ නායකයෙකු ලෙස ද සේවය කරන්නේය.

# CTS පාඨමාලා විස්තර

ශිෂ්‍යයන් කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ පාඨමාලා හැදෑරීම සඳහා සාදරයෙන් පිළිගන්නා අතර අධ්‍යයන පාඨමාලා හැදෑරීම සඳහා අප ඔබ දිරිමත් කරන්නේ කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය වෙතින් ඔබට ලබාගත හැකි උපරිමය අත්කරගනු සඳහාය.

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය විසින් පෙළ හතරක අධ්‍යාපනයක් පිරිනමයි. ඒ සියල්ල ම ආසියානු දේවවේදී සංගමය (ATA) විසින් පිළිගනු ලැබූ ඒවා වේ. ඔබට වඩාත් ගැළපෙන්නේ කුමන පාඨමාලාවදැයි කියවා අනාවරණය කරගන්න.

**ක්‍රිස්තියානි අධ්‍යාපන සහතිකය (CCS)**
21 වැනි සියවසේ ජීවිතය, රැකියාව හා සේවය වෙනුවෙන් (ගිහි) කිතුනුවන් සවිගැන්වීම පිණිස මෙය සැලසුම් කර ඇත.
ඉගැන්වීම් මාධ්‍ය: ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ
*අවශ්‍ය සම්මාන ප්‍රමාණය 36කි*

**ක්‍රිස්තියානි අධ්‍යාපන සහතිකය: ළමා සේවා ක්ෂේත්‍රය (CCS-CM)**
සභාව සහ සමාජය සඳහා ඵලදායී ළමා සේවා සේවකයින් සන්නද්ධ කිරීමට නිර්මාණය කර ඇත.
ඉගැන්වීම් මාධ්‍ය: සිංහල සහ දෙමළ
*අවශ්‍ය සම්මාන ප්‍රමාණය 36කි*
*අන්තර්ජාලය හරහා ඉගැන්වේ*

**දේවධර්ම ඩිප්ලෝමා (DipTh)**
කිතුනු සේවකයන් සඳහා ගැඹුරු බයිබලීය අන්තර් දෘෂ්ටියක් හා සේවය සඳහා නිපුණත්වයක් ලබාදීම සඳහා මෙය සැලසුම් කර ඇත.
ඉගැන්වීම් මාධ්‍ය: ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ
*අවශ්‍ය සම්මාන ප්‍රමාණය 72කි*

**දේවධර්ම උපාධිය (BTh)**
සභා නායකත්වය (දේවගැති සේවය, ඉගැන්වීම සහ එවැනි සේවා) සඳහා කිතුනුවන් පුහුණු කිරීම සඳහා මෙය සැලසුම් කර ඇත.
ඉගැන්වීම් මාධ්‍ය: ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ
*අවශ්‍ය සම්මාන ප්‍රමාණය 108කි*

***වැඩි විස්තර/ සහය සඳහා විමසන්න:***
අධ්‍යයන කාර්යාලය
011 2890809; registrar@cts.lk; www.cts.lk

# ක්‍රිස්තියානි අධ්‍යාපන සහතිකය
# ළමා සේවා ක්ෂේත්‍රය

**<u>පාඨමාලාව:</u>**

- පාඨමාලාවක් සාමාන්‍යයෙන් සතියකට දෙවරක් පැය 3ක කාලයක් පැවැත්වේ.
  - සෑම සඳුදා දිනකම ප.ව.1:00-4:00 දක්වා සහ
  - සෑම සිකුරාදා දිනකම පෙ.ව.9:30-ප.ව.12:30 දක්වා
- සෑම විෂයක් සඳහා සම්මාන පැය දෙකකි.
- වසර 2කින් ශිෂ්‍යයා හට මෙම විෂයමාලාව නිම කළ හැකිවන අයුරින් සැලසුම් කර ඇත.

| | විෂයන් | සම්මාන |
|---|---|---|
| අනිවාර්ය | | |
| බයිබලය සහ දේවධර්ම විෂයන් | 04 | 08 |
| ළමා සේවා විෂයන් | 04 | 08 |
| වෛකල්පික විෂයන් | 10 | 20 |
| සම්මන්ත්‍රණ | 04 | 00 |
| එකතුව | 22 | 36 |

සැ.යු.: සහතික පත්‍රය ලබාගැනීමට ඉහත සියලු විෂයන් සම්පූර්ණ කළ යුතු වේ.

**<u>පාඨමාලා දේශන පැවැත්වීම:</u>**

- **අන්තර්ජාලය හරහා:** පාඨමාලාව Zoom තාක්ෂණය හරහා ඉගැන්වෙන අතර අදාළ සටහන් Moodle පහසුකම තුළින් ලබා ගත හැකිය. ඔබට වේගවත් අන්තර්ජාල සම්බන්ධතාවක් හා ඩිජිටල් උපාංගයක් අවශ්‍ය වනු ඇත.

**<u>සන්නිවේදන තොරතුරු:</u>**

ක්‍රිස්ති එදිරිසිංහ මිය
සම්බන්ධීකාරක: ළමා සේවා ක්ෂේත්‍රය
දුරකථන අංකය: +94 764823127
විද්‍යුත් තැපැල්: cm@cts.lk

# ක්‍රිස්තියානි අධ්‍යාපන සහතිකය
# ළමා සේවා ක්ෂේත්‍රය

**<u>අනිවාර්ය: බයිබලය සහ දේවධර්ම විෂයන්</u>**

දරු දැරියන් පිළිබඳව බයිබලීය දැක්ම
දේවධර්මයට හැඳින්වීම
නව ගිවිසුමට හැඳින්වීමක්
ක්‍රිස්තියානි ලෝකදෘෂ්ටියක් වර්ධනය කිරීම

**<u>අනිවාර්ය: ළමා සේවා විෂයන්</u>**

සාකල්‍ය ළමා සංවර්ධනය
දරු දැරියන්ට බයිබලය ඉගැන්වීම
ළමා සේවයේ ආචාරධර්ම
ළමයා, කිතුනු සභාව හා ධර්මදූත සේවය

**<u>වෛකල්පික විෂයන්</u>**

අපයෝජනයට ලක් වූ දරුවන් වෙත සේවය
කිතුනු දැක්ම තුළ සන්නිවේදනය
අවදානම් සහිත දරුවන් කෙරෙහි සභාවේ භූමිකාව
ඔබ තුළ ඇති නායකත්වය වර්ධනය කිරීම
රැකවරණය සලසන්නාගේ ආත්මික හැඩගැස්ම සහ ආතතිය කළමනාකරණය
සංස්කෘතිය අවබෝධ කරගැනීම
කිතුනු දෙමාපියභාවය
යෞවන යෞවනියන් සඳහා සේවය
ළමා උපදේශනය
දරු දැරියන් සඳහා ශ්‍රාවකත්වය

*නොවැළැක්විය හැකි හේතු මත ප්‍රකාශිත විෂයන්වල වෙනස්කම් සිදුවිය හැකිය.*

පළමු මහලේ පිහිටි

CTS
පොත් හලට
පිවිසෙන්න

CTS ප්‍රකාශන





CTS පුස්තකාලය

පොත් 41,000 +
එකතුවක්

ඉංග්‍රීසි | සිංහල | දෙමළ

CTS පුස්තකාලය හා අදම සම්බන්ධ වන්න!
වැඩි විස්තර සඳහා
+ 94 112 890809 | library@cts.lk

CTS පුස්තකාලය සියලු සභාවන්ට විවෘතය

189 දුටුගැමුණු වීදිය, කොහුවල
(+94) 11 2890809 | registrar@cts.lk | www.cts.lk